# බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

| 01. | සම්බන්ධ වන ආයතන | යොමු අංකය : | දිනය: |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව : බන්ධනාගාර | ඩී8/21/ජා.ශි/ස.ශි | 2014.04.30 |
| 1.2 | අමාත්‍යාංශය: බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | MRPR/2/3/17-16 | 2014.05.08. |
| 1.3 | කළමණාකරණ අධ්‍යක්ෂ ජනරාල් තනතුර අනුමත කිරීම : | DMS/B2/48/01/Vol.II | 2013.09.24 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : | EST-2/RECRU/05/4868 | 2014.07.01 |
| 1.5 | වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය: | NCP/6/18/096/SR-II | 2014.06.03 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : | PSC/EST/02-01-18/05/2014 | 2014.10.23 |

**02. පත් කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ප්‍රාථමික ශිල්පීය

3.2 ශ්‍රේණි : III, II, I සහ විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම හා පවත්වා ගෙන යාම සඳහා වන මූලික අවශ්‍යතාවයන් වන ඉදිකිරීම්, නඩත්තු, අලුත්වැඩියා, ආලෝකකරණය වැනි මූලික කාර්යයන් අතුරින් තෘතීය හා වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හතර (04) වැනි මට්ටමේ කාර්මික පුහුණු සහතිකයක්/ ප්‍රවීණතා සහතිකයක් මගින් තහවුරු කෙරෙන කාර්මික / ශිල්පීය / වෘත්තීය කුසලතාවයන් අවශ්‍ය වන කාර්යයන් පවරනු ලබන තැනැත්තන්ගෙන් සමන්විත සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.** තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

**05.** වැටුප්

5.1 වැටුප් කේත අංකය : PL 3-2006 A

5.2 වැටුප් පරිමාණය : රු 12470- 130X-10 -145 X-10 -160X10- 170X 12 -18860

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය (රු) |
|---|---|---|
| III ශ්‍රේණිය | පියවර 01 | 12470 |
| II ශ්‍රේණිය | පියවර 12 | 13915 |
| I ශ්‍රේණිය | පියවර 22 | 15380 |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | 16990 |

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ඡායාරූප ශිල්පී | III, II, I හා විශේෂ ශ්‍රේණිය | 01 | දෙපාර්තමේන්තුවේ විශේෂ මාධ්‍ය ඒකකයට අදාළව පැවරෙන රාජකාරි |
| සංස්කරණ ශිල්පී | III, II, I හා විශේෂ ශ්‍රේණිය | 01 | |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - ඡායාරූප ශිල්පී - 01
සංස්කරණ ශිල්පී - 01

**"ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණිය යන ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ."**

**07.බඳවා ගැනීමේ ක්‍රමය**

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III වන ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් - අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩිවාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක්(06) ක් සමත්වී තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් - එක් එක් ක්ෂේත්‍රයෙහි කාර්ය භාවිතයට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) සිව්වැනි (04) මට්ටමට ඇතුළත් වන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවන් සාර්ථකව හදාරා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලබයි.

7.2.2.4 කායික සුදුසුකම් :

I. අවම උස අඩි 5 අඟල් 4 (පිරිමි) නොඅඩු විය යුතුයි.

II. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයක් තිබිය යුතු අතර, මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතු අතර, විශිෂ්ඨ චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතුයි. චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.

7.2.2.5 වෙනත් :

1. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුයි.
2. තනතුරට බඳවා ගැනීම සඳහා 7.2.2.1 සිට 7.2.3.2 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවන නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18
7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.2.4.2. වෘත්තීය පරීක්ෂණය

| පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. ඡායාරූප ශිල්පි | | |
| • කැමරාවක් ක්‍රියාකරවීම හා රූපගත කිරීම | 60 | 40% |
| • ආලෝකය සැපයීම හා නවීන තාක්ෂණික ක්‍රම භාවිතය | 20 | |
| • පැහැදිලි ඡායාරූප ගැනීම | 20 | |
| එකතුව | 100 | |
| II. සංස්කරණ ශිල්පි | | |
| • සංස්කරණ ශිල්පි තනතුරට අදාළ තාක්ෂණික ක්‍රම භාවිතයෙන් සංස්කරණය කිරීම හා උපදෙස් භාවිතය | 100 | 40% |

සටහන :

(1) ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත් කිරීමේ බලධාරියා විසින් සිදු කරනු ඇත.

(2) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනු පිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.̣4.2.1 වෘත්තිය සම්මුඛ පරීක්ෂණය පවත්වන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7.2.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : අදාළ නොවේ.

.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : I. ඡායාරූප ශිල්පි

| ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගනු ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| • අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 35 | 40% |
| • අතිරේක වෘත්තිය සුදුසුකම් | 15 | |
| • පළපුරුද්ද | 20 | |
| • ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාව | 10 | |
| • පරිගණක දැනුම | 15 | |
| • සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන ලද කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

II. සංස්කරණ ශිල්පි

| ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගනු ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| • අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 35 | 40% |
| • අතිරේක වෘත්තිය සුදුසුකම් | 15 | |
| • පළපුරුද්ද | 20 | |
| • භාෂා ප්‍රවීනතාව | 10 | |
| • පරිගණක දැනුම | 15 | |
| • සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන ලද කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

සටහන : (1) ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත එක් එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත් කිරීම් බලධාරියා විසින් සිදුකරනු ඇත.

(2) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුලු ලකුණුවල කුසලතා අනු පිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධාරියා :- බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීමක් පලකිරීමෙන් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් පලකිරීම සහ වෙබ් අඩවියේ පලකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම.

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද. | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර. | ලිඛිත |
| II වන කාර්යක්ෂමතා කඩඉම | II වෙනි ශ්‍රේණියට උසස් වී වසර තුන (03)ක් ගතවීමට පෙර. | ලිඛිත |
| III වන කාර්යක්ෂමතා කඩඉම | I වෙනි ශ්‍රේණියට උසස් වී වසර පහ (05)ක් ගතවීමට පෙර. | ලිඛිත |

(ඇමුණුම බලන්න)

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

I වන කාර්යක්ෂමතා කඩඉම : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

II වන කාර්යක්ෂමතා කඩඉම : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

III වන කාර්යක්ෂමතා කඩඉම : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

09. භාෂා ප්‍රවීණතාවය

9.1

| ශ්‍රේණිය | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය පරිවාස කාලය තුල ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව නියමිත මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා තිබිය යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම :

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 **සපුරාලිය යුතු සුදුසුකම් :**

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය(10) උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගැයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගෙන තිබීම.

VI. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීමට පත්කිරීමේ බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන තිබීම.

II. උසස්කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය(09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව 1 ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීමේ බලධාරියා විසින් සිදුකරනු ලැබේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන තිබීම.

II. උසස්කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධාරියා විසින් සිදුකරනු ලැබේ.

**සංලක්ෂය :** • සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් විමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :

සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයේ අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම : අදාළ නොවේ.

15. සෑම පත් වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලකා නොමැති යම් කරුණක් වේතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන : ..........................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : සී.එස්.අමරවික්‍රම

තනතුර : පරිශීලන නිලධාරී I, භාණ්ඩාගාර කොමසාරිස් ...

දිනය : 2016.02. 17

පරීක්ෂා කළේ : අත්සන : ..........................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එම්.වී. ගුණවර්ධන, භාණ්ඩාගාර කොමසාරිස් (පාලන)

තනතුර : භාණ්ඩාගාර මූලස්ථානය, කොළඹ - 09.

දිනය : 2016.02.17

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : එච්.එම්.එස්.සී. ධනසිංහ

තනතුර : භාණ්ඩාගාර කොමසාරිස් ජනරාල්

නිල මුද්‍රාව : භාණ්ඩාගාර මූලස්ථානය, කොළඹ 09.

දිනය : 2016.02. 17

යොමු අංකය : MPRRH/06/01/බන්ධ සදහා ගැ.පරි/ප්‍රාථ.ශි

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හි ප්‍රාථමික ශිල්පීය සේවා ගණය

ඉහතකුර සදහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................

නම : ..........................................

V. Sivagnanasothy
ලේකම්
Secretary
Ministry of Prison Reforms, Rehabilitation,
Resettlement and Hindu Religious Affairs අමාත්‍යාංශය
No 146, Galle Road, Colombo 03.

දිනය : 2016.03.17

නිල මුද්‍රාව : ..........................................

---

යොමු අංකය : PSC/EST/02-01-18/05/2014

බන්ධනාගාර දෙපාර්තමේන්තුව හි ප්‍රාථමික ශිල්පීය සේවා ගණය

සදහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2014 - 10 - 23 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........................................

නම : ..........................................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2016.04 - 04

නිල මුද්‍රාව ..........................................

එච්. එම්. ගාමිණි සෙනෙවිරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

විභාග පිළිබඳ ආකෘතිය.

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ශ්‍රේණිය ජායාරූප ශිල්පී/ සංස්කරණ ශිල්පී කාර්යක්ෂමතා කඩඉම් විභාගය I

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බන්ධනාගාර නිත්‍ය නියෝග | පැය 01 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බන්ධනාගාර නිත්‍ය නියෝග | බන්ධනාගාර නිත්‍ය නියෝග ඇසුරින් කෙටි ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයිය යුතුය. |

සකස් කළේ :
අත්සන :
නම : සී.එස්.අමරවික්‍රම
පරිපාලන නිලධාරී I
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2016.02.15

පරීක්ෂා කළේ :
අත්සන :
නම : එම්.ටී.ගුණවර්ධන
බන්ධනාගාර කොමසාරිස් (පාලන)
තනතුර : බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.
දිනය : 2016.02.17

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය : 2016.02.17
නිල මුද්‍රාව :

ඇමුණුම 02

විභාග පිළිබඳ ආකෘතිය.

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය ඡායාරූප ශිල්පී/ සංස්කරණ ශිල්පී කාර්යක්ෂමතා කඩඉම් විභාගය I

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 01 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | පරිච්ඡේද අංක II, III, IV,V, VII, VIII, XII, XIII, XIV, XVI, XXIV |

සකස් කළේ :
අත්සන :..........
නම :..........සී.එස්.අමරවික්‍රම
පරිපාලන නිලධාරී I
තනතුර :.....බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවෙන්
දිනය : 2016.02. 17

පරීක්ෂා කළේ :
අත්සන :..........
නම :..........එම්.බී. ගුණවර්ධන
තනතුර :..........බන්ධනාගාර කොමසාරිස් (පාලන)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.
දිනය : 2016.02. 17

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ..........එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : ..........බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය : 2016.02. 17
නිල මුද්‍රාව : ..........

ඇමුණුම 03

<u>විභාග පිළිබඳ ආකෘතිය.</u>

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය ඡායාරූප ශිල්පී/ සංස්කරණ ශිල්පී කාර්යක්ෂමතා කඩඉම් විභාගය I

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 01 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | පරිච්ඡේද අංක II, III, IV,V, VII, VIII, XII, XIII, XIV, XVI, XVII, XVIII, XXIII, XXIV, XXVI, XXXII |

සකස් කළේ :

අත්සන :..................................................

නම :..........සී.එස්.අමරවික්‍රම..........

තනතුර පරිපාලන නිලධාරී I බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

දිනය : 2016.02. 17

පරීක්ෂා කළේ :

අත්සන :..................................................

නම :..........එම්.ඩී. ගුණවර්ධන..........

තනතුර :..........බන්ධනාගාර කොමසාරිස් (පාලන)..........
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

දිනය : 2016.02.17

අත්සන : ..................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ..........එච්.එම්.එන්.සී. ධනසිංහ..........

තනතුර : ..........බන්ධනාගාර කොමසාරිස් ජනරාල්..........
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

දිනය : 2016.02. 17

නිල මුද්‍රාව : ..................................................